# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 987 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 10/08/2023 පැය 1105

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2023.08.10 වන අද දින උද්ඝෝෂකයින් පිරිසක් කොටුව පොලිස් වසමේ පැවැත්වීමට නියමිත උද්ඝෝසණයක් සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානාධිපතිට ලැබුණු තොරතුරු මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබිණි.

ඒ අනුව උද්ඝෝෂණයක් හෝ පෙළපාලියක් පැවැත්වුවහොත් උද්ඝෝෂකරුවන් හා මහජනතාව අතර ගැටුම්කාරී තත්ත්වයක් හා නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති වී මහජන පීඩාවක් ඇති විය හැකි බැවින්, මහජන පීඩාවක් ඇතිවීම වළක්වාලීමට හා මහජන ආරක්ෂාව වෙනුවෙන් 2023.08.10 වන දින පැය 0900 සිට පැය 1800 දක්වා කාලය තුල කොටුව පොලිස් වසමේ ජනාධිපති ලේකම් කාර්යාලය, මහබැංකුව, ජනාධිපති නිල නිවස, මුදල් අමාත්‍යාංශය, ගාලු මුවදොර පිටිය පරිශ්‍රය, සෙරමික් හන්දිය සිට එන්.එස්.ඒ වටරවුම, එන්.එස්.ඒ වටරවුමේ සිට ගාලුමුවදොර වටරවුම සහ බැංකු මාවතට ඇතුළු වීම වලකින ලෙසත්, පොදු හා පුද්ගලික දේපල වලට හානි නොකරන ලෙසටත් මහජනයා ප්‍රකෝපවිය හැකි ප්‍රචණ්ඩකාරී සිදුවීම් සිදු නොකරන ලෙසටත්, නියෝග කරමින් වග උත්තරකරුවන් වන අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු විතාරණගේ මධුෂාන් චන්ද්‍රජිත් හා අන්තර් විශ්ව විද්‍යාල භික්ෂු බල මණ්ඩලයේ කැඳවුම්කරු පූජ්‍ය ගල්වැව සිරිධම්ම හිමි ඇතුළු වගඋත්තරකරුවන් 10 දෙනෙකුට හා ඔවුන් සමඟ සහභාගී වන වෙනත් තැනැත්තන් වෙත අධිකරණ ආඥාවක් නිකුත් කර ඇත.

මෙම ආඥාව කඩ කිරීම ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බවට ආඥාව මඟින් දැනුම්දී ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**